# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1918/13 - 2015 ජුනි මස 10 වැනි බදාදා - 2015.06.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාව**

(සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය)

සබරගමුව පළාත් සභාවේ 2014 අංක 04 දරන ළමා නිවාස ප්‍රඥප්තිය

2015.05.14 දින සබරගමුව පළාතේ පළාත් සභාවේ ගරු සභාපතිතුමා විසින් සහතිකය සටහන් කරන ලදී.

2015.05.26 දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලදී.

සබරගමුව පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

**සබරගමුව පළාතේ පළාත් සභාවේ 2014 අංක 04 දරන ළමා නිවාස ප්‍රඥප්තිය**

2014.09.30 වන දින සභා සම්මත කරන ලදුව 2015.05.26 වන දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලද සබරගමුව පළාත් සභාවේ 2014 අංක 04 දරන ළමා නිවාස ප්‍රඥප්තිය නම් වූ මෙම ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැනගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

ලලිත් දොඩම්කොටුව,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2015 ජුනි මස 01 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

***සබරගමුව පළාතේ පළාත් සභාවේ 2014 අංක 04 දරන ළමා නිවාස ප්‍රඥප්තිය***

සබරගමුව පළාත තුළ වෙසෙන අනාථ, අත්හල, අසරණ හා අපයෝජනයට ලක් වූ ළමයින්ගේ රැකවරණය හා සංවර්ධනය උදෙසා පවත්වනු ලබන ආයතන ලියාපදිංචි කිරීම, අධීක්ෂණය කිරීම, පරිපාලනය හා මෙහෙයවීම සඳහා ද ඊට අනුෂාංගික වූ කරුණු සඳහා ද විධිවිධාන සැලසීම සඳහා වූ ප්‍රඥප්තියයි. 1941 අංක 22 දරන අනත්දරු නිවාස ආඥා පනත (142 අධිකාරය) මෙම ප්‍රඥප්තියට අනනුකූල වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය සබරගමුව පළාත් සභාවේ 2014 අංක 04 දරන ළමා නිවාස ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබේ. — ලුහුඬු නාමය

02. මෙම ප්‍රඥප්තිය සබරගමුව පළාතේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කළ දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය. — ක්‍රියාත්මක වන දිනය



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## *I* වන කොටස

### අරමුණු සහ කාර්යයන්

අරමුණු හා කාර්යයන්

03. සබරගමුව පළාත තුළ සිටින උපතේ සිට අවුරුදු 18 දක්වා වූ අනාථ, අත්හල, අසරණ හා අපයෝජනයට ලක් වූ ළමුන්ට සුභසිද්ධිය සැලසීම සඳහා පහත සඳහන් කාර්යයන් ඉටු කිරීම මෙම ප්‍රඥප්තියේ අරමුණ වේ.

(1) නේවාසික පසුබිමක් තුළ භාරය, ආරක්ෂාව හා රැකවරණය සැලසීම
(2) වයසට හා වැඩීමට අනුකූල සමබල ආහාරපාන ලබා දීම
(3) සෞඛ්‍යාරක්ෂිත සහ පරිසරානුකූල ඇඳුම් පැළඳුම් ලබා දීම
(4) මානසික සුරක්ෂිතතාවයට හා සංවර්ධනයට අවශ්‍ය පහසුකම් සැපයීම
(5) වයසට සරිලන්නා වූ විධිමත්, නොවිධිමත්, අධ්‍යාපනයක් සහ වෘත්තීය පුහුණුවක් ලබා දීම
(6) දක්ෂතා හා නිර්මාණශීලී හැකියාවන් වර්ධනය වන පරිදි සෞන්දර්යාත්මක ක්‍රීඩා සහ වෙනත් අවශ්‍ය පහසුකම් සැලසීම
(7) රසඥතාව වර්ධනය වන පරිදි ජන සංනිවේදන පහසුකම් සැලසීම
(8) දැනුම හා බුද්ධි වර්ධනයට අවශ්‍ය පුස්තකාල හා වෙනත් පහසුකම් සැපයීම
(9) ආගමික, සංස්කෘතික, සදාචාරාත්මක හා ආධ්‍යාත්මික සංවර්ධනයට අවශ්‍ය පහසුකම් සැපයීම
(10) ඥාතීන් හා භාරකරුවන් සමග මනා සහසම්බන්ධතාවයක් ඇතිකර සුදුසු අවස්ථාවේ දී සුදුසු පරිදි සමාජගත කිරීම

පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ හා පළාත් කොමසාරිස්වරයාගේ කාර්යභාරය

04. මෙම ප්‍රඥප්තියේ කාර්යයන් ඉටු කිරීම සඳහා පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරෙන අදාල කටයුතු මෙහෙයවීම, අධීක්ෂණය හා පරිපාලනය පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා (මෙහි මින් මතුව කොමසාරිස්වරයා යනුවෙන් හඳුන්වනු ලබන) වෙත පැවරෙන්නේය.

## *II* වන කොටස

### ළමා නිවාස ලියාපදිංචි කිරීම

ළමා නිවාස

05. සබරගමුව පළාත තුළ සිටින උපතේ සිට අවුරුදු දහ අට දක්වා වූ අනාථ, අත්හල, අසරණ හා අපයෝජනයට ලක් වූ ළමුන් භාර ගන්නා, ඔවුන්ට ආරක්ෂාව සලසන හා ඔවුන්ට නේවාසිකව රැකබලා ගන්නා සබරගමුව පළාතේ පිහිටි සෑම ආයතනයක්ම මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට ළමා නිවාසයක් ලෙස සැලකිය යුතුය.

ලියාපදිංචි විය යුතු බව

06. (1) සබරගමුව පළාත තුළ පිහිටි සෑම ළමා නිවාසයක්ම මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචිය ලබාගත යුතුය.

(2) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට පෙර ආරම්භ කරනු ලැබ 1941 අංක 22 දරන අනත්දරු නිවාස ආඥා පනත යටතේ ලියාපදිංචි කර පවත්වා ගෙන යනු ලබන සෑම රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතනයක්, අර්ධ රාජ්‍ය ආයතනයක් සහ රජයට සම්බන්ධ ආයතනයක් වන සෑම අනත්දරු නිවාසයක්ම මෙම ප්‍රඥප්තිය යටතේ නැවත සබරගමුව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ළමා නිවාසයක් ලෙස ලියාපදිංචි විය යුතුය.

(3) කොමසාරිස්වරයා පූර්වයෙන් කරන ලද පරීක්ෂණයන්ද, පෙර ලියාපදිංචිය ද සලකා බලා ලියාපදිංචිය සඳහා අවසර දිය යුතු අතර වසර තුනකට වරක් කරනු ලබන සමාලෝචනයට අනතුරුව නැවත ලියාපදිංචිය අලුත් කළ යුතුය.

(4) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට පසු ආරම්භ කරනු ලබන සෑම ළමා නිවාසයක්ම මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචිය විය යුතුය. ආයතන සඳහා ළමුන් ඇතුළත් කර ගත යුත්තේ ලියාපදිංචි කිරීමෙන් පසුව වන අතර ළමුන් ඇතුළත් කිරීම කොමසාරිස්වරයා මගින් සිදුවිය යුතුය.

ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරයා

(5) මෙම ප්‍රඥප්තිය පරිදි, සබරගමුව පළාත් ළමා නිවාස ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරයා වශයෙන් සබරගමුව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා ක්‍රියා කරන්නේය.

07. (1) හය වන වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබීම සඳහා ඉල්ලුම් කරනු ලබන සෑම ළමා නිවාසයක්ම පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය. ලියාපදිංචිය සඳහා පූර්ව අවශ්‍යතා

(අ) ළමා නිවාසයක් පවත්වා ගෙන යාම පරමාර්ථයක් කොට ගත් ව්‍යවස්ථාවක් සහිත ලියාපදිංචි රාජ්‍ය හෝ රාජ්‍ය නොවන, අර්ධ රාජ්‍ය සහ රජයට සම්බන්ධ ඕනෑම ආයතනයක් වීම.

(ආ) ළමා නිවාසයක් ලියාපදිංචිය සඳහා අවම වශයෙන් ළමුන් දහයක් සඳහා අවම අවශ්‍යතා සපුරා තිබිය යුතුය.

(ඇ) ළමා නිවාසයක් පවත්වා ගෙන යන් ස්ථානය ළමුන්ගේ මානසික සංවර්ධනයට හිතකර පරිසරයක් විය යුතුය.

(ඈ) ළමා නිවාසයක් පවත්වා ගෙන යන ආයතනයට සියළුම චංචල හා නිශ්චල දේපල වල නීත්‍යානුකූල අයිතිය පැවතීම අනිවාර්ය වේ.

(11) ළමා නිවාසය නමින් රාජ්‍ය බැංකුවක ගිණුමක් පැවතිය යුතු අතර, සේවක නඩත්තු, ජල බිල්පත් හා විදුලි බිල්පත් ගෙවීම ළමුන්ගේ නඩත්තුව සඳහා පවත්වාගෙන යා යුතු අවම ශේෂය කලින් කලට අමාත්‍යවරයා විසින් නියෝග මගින් පැනවිය හැකිය.

08. සෑම ළමා නිවාසයක්ම ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් ළමා නිවාසයේ කළමනාකරු විසින් මෙම ප්‍රඥප්තියේ පළමු උප ලේඛනයේ සඳහන් ආකෘති පත්‍රයේ ප්‍රකාර සකස් කරන ලද ඉල්ලුම් පත්‍රයක් මගින් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් කරන ආකාරය

09. ළමා නිවාසයක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් ලැබුන පසුව කොමසාරිස්වරයා විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් වාර්තාවක් සපයන ලෙස අධිකරණ කලාපය භාරව සිටින ස්ථානභාර පරිවාස නිළධාරීට හෝ කොමසාරිස්වරයා විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ සබරගමුව පළාතේ පරිවාස නිළධාරියෙකුට හෝ නියම කරනු ලැබිය යුතුය. වාර්තා කැඳවීම

(අ) එකී ළමා නිවාසය මෙම ප්‍රඥප්තියේ 6, 7 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා වන සුදුසුකම් සපුරා තිබේද යන වග සහ

(ආ) මෙම ප්‍රඥප්තියේ 25 වන වගන්තිය යටතේ නියමය කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූලද යන වග

10. මෙම ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ සඳහන් නියමය ලැබී සති හතරක් ඇතුළත අදාළ වාර්තා එකී නිළධාරියා විසින් කොමසාරිස්වරයා වෙත ලබා දිය යුතුය. වාර්තා ලබා දීම

11. මෙම ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ සඳහන් වාර්තා ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින් ළමා නිවාසය මගින් නේවාසික ළමුන්ගේ උපරිම සුභසිද්ධිය සලසන්නේද යන්න හා අදාළ ළමා නිවාස ලියාපදිංචිය අපේක්ෂා කරන විට ළමා නිවාසයක් වශයෙන් පවතින්නේ නම් ප්‍රමිතීන්ට අනුකූලව පාලන අධිකාරිය කටයුතු කර තිබේදැයි පරීක්ෂාකර බැලීම සඳහා කොමසාරිස්වරයා විසින් ළමා නිවසයට ගොස් පරීක්ෂා කර බැලිය යුතුය. කොමසාරිස්වරයා විසින් පරීක්ෂා කිරීම

12. (1) 11 වන වගන්තියේ සඳහන් පරීක්ෂණයකින් පසු කොමසාරිස්වරයා සෑහීමට පත්වන්නේ නම් එම ළමා නිවාසය පරීක්ෂණ දිනයේ සිට මාස තුනක් ඇතුළත ලියාපදිංචි කළ යුතුය. ලියාපදිංචි කිරීම

(2) ඉහත 1 උප වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සමග කොමසාරිස්වරයා හා පාලනාධිකාරිය ළමා නිවාසය පවත්වාගෙන යාමට අදාලව නිශ්චිත කොන්දේසි සහිතව ගිවසුමකට ඇතුළත් විය යුතුය.

13. මෙම ප්‍රඥප්තියේ 10 වගන්තියේ සඳහන් වාර්තාව ලැබීමෙන් පසු කොමසාරිස්වරයාගේ පරීක්ෂණයෙන් ලියාපදිංචිය සඳහා සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන ළමා නිවාසය සමග ගිවිසුමක් අත්සන් කිරීමෙන් අනතුරුව ඒ වෙත ඉහත 12 වගන්තිය යටතේ ගිවිසුමක් ලියාපදිංචි කර ගිවිසුම්ගත වූ ළමා නිවාසය සඳහා උප ලේඛණයේ ආකෘතියට අදාල බලපත්‍රය කොමසාරිස්වරයා විසින් නිකුත් කළ යුතුය. ලියාපදිංචි කිරීමේ බලපත්‍රය

(අ) ලියාපදිංචි කරනු ලබන සෑම ළමා නිවාසයකම නම, ලිපිනය, ලියාපදිංචි අංකය හා දිනය ස්වේච්ඡා සංවිධානයේ නම සහ වෙනත් අවශ්‍ය වේ යැයි කොමසාරිස්වරයා විසින් සලකනු ලබන තොරතුරු ඇතොත් ඒ තොරතුරුද ඇතුළත් කරමින් ලේඛන ගත කිරීම සඳහා කොමසාරිස්වරයා විසින් ලේඛනයක් පවත්වාගෙන යා යුතුය.

**ලියාපදිංචි කළ නොහැකිබව දැන්වීම**

14. ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරන ලද ළමා නිවාසයක් 7 වන වගන්තියේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව සනාථ වන්නේ නම් එවිට ඒ ළමා නිවාසය ලියාපදිංචි කළ නොහැකි බව හේතු සහිතව කොමසාරිස්වරයා විසින් ළමා නිවාසයේ කළමනාකරු වෙත දන්වා යැවිය යුතුය.

**අභියාචනා**

15. මෙම ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ සඳහන් දැන්වීමෙන් අතෘප්තියට පත්වන ළමා නිවාසයේ කළමනාකරු විසින් දැන්වීමේ දින සිට දින තිහක් ඇතුළත ඒ පිළිබඳව අභියාචනයක් ලේකම් වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

**අභියාචනා පිළිබඳ තීරණ**

16. මෙම ප්‍රඥප්තියේ 15 වගන්තිය යටතේ අභියාචනයක් ලැබී දින හැටක් ඇතුළත ලේකම් විසින් හෝ ඔහු විසින් පත් කරනු ලබන කොමසාරිස්වරයාට සමාන හෝ ඔහුට ඉහල තනතුරක් දරන නිළධාරි දෙදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් මගින් හෝ ඒ පිළිබඳව පරීක්ෂණයක් කොට පහත සඳහන් තීරණයන් ගෙන් එකක් ගත යුතුය.

i. ලියාපදිංචි කළ නොහැකි බව කළමනාකරුට දැන්වීම සහ එහි පිටපතක් කොමසාරිස් වෙත යොමු කිරීම.

ii. ලියාපදිංචි කිරීමට කටයුතු කරන ලෙස කොමසාරිස්වරයාට දැනවීම.

iii. 7 වන වගන්තියේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කිරීමට අවුරුද්දකට නොවැඩි සහන කාලයක් ලබා දීම.

**තීරණය ක්‍රියාත්මක කිරීම**

17. (1) මෙම ප්‍රඥප්තියේ 16 වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි කිරීමට කටයුතු කරන ලෙස කොමසාරිස්වරයාට දැන්වීමේදී කොමසාරිස්වරයා විසින් ඒ තීරණය මසක් ඇතුලත ක්‍රියාත්මක කොට ඒ බව ලේකම්වරයාට දැන්විය යුතුය.

(2) මෙම ප්‍රඥප්තියේ 16 වගන්තිය ප්‍රකාරව දෙනු ලබන සහන කාලය අවසන් වීමෙන් පසු හෝ සහන කාලය අවසන් වීමට පෙරාතුව කළමනාකරු විසින් ඉල්ලුම් කරනු ලබන අවස්ථාවක ලේකම්වරයා විසින් නැවත විමර්ශනය කර එම ආයතනය ලියාපදිංචි කිරීම හෝ නොකිරීම හෝ සම්බන්ධයෙන් තීරණ ගත යුතු අතර, අදාළ තීරණය පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාට සහ ආයතනයේ කළමනාකරුට දැන්විය යුතුය.

**ළමා නිවාසයක ලියාපදිංචිය අවලංගු කිරීම**

18. පහත සඳහන් යම් අවස්ථාවකදී තමා විසින් හෝ තමා විසින් බලය පවරනු ලබන වෙනයම් නිළධාරියෙකු විසින් හෝ කරනු ලබන පරීක්ෂණයකින් පසුව යම් ළමා නිවාසයක් ලියාපදිංචිය අවලංගු කිරීමට කොමසාරිස්වරයාට බලය ඇත.

(1) ඒ ළමා නිවාසය පවත්වා ගෙන ගිය රාජ්‍ය, රාජ්‍ය නොවන, අර්ධ රාජ්‍ය, රජයට සම්බන්ධ ආයතනයක සාමාජිකයින්ගෙන් ව්‍යවස්ථාපිත රැස්වීමකදී පැමිණ ඡන්දය දෙන බහුතරයකගේ ඡන්දයෙන් සම්මත යෝජනාවක් මගින් ළමා නිවාසය පවත්වා ගෙන යාමට නොහැකි බව වසා දැමීමට යෝජිත දිනයට තුන් මසකට කලින් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබ එම ලිඛිත දැනුම් දීම කොමසාරිස්වරයා විසින් පිළිගනු ලැබූ අවස්ථාවකදී,

(2) මෙම ප්‍රඥප්තියේ 33 වන වගන්තිය යටතේ නිසි බලධරයෙකු පත් කිරීමට අපහසු වන අවස්ථාවකදී එම බලධාරියට තම කටයුතු කරගෙන යාමට නොහැකි තත්ත්වයක් උදා වන විටදී,

(3) මෙම ප්‍රඥප්තියේ 25 වන වගන්තිය අනුව නිකුත් කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූලව සහ වරින් වර කරනු ලබන රෙගුලාසි කොන්දේසි සහ චක්‍රලේඛ අනුව ළමා නිවාසය පවත්වා ගෙන යෑමට පාලක මණ්ඩලය කටයුතු නොකරන අවස්ථාවකදී,

(4) මෙම ප්‍රඥප්තියේ 37 වන වගන්තිය අනුව ළමා නිවාසය සඳහා නව පාලක මණ්ඩලය පත් කර ගැනීමට නොහැකි වූ අවස්ථාවකදී,

(5) මෙම ප්‍රඥප්තියේ 12 වගන්තිය ප්‍රකාරව ඇති කර ගත් අවබෝධතා ගිවිසුමේ කොන්දේසි ඉටු කිරීමට අපොහොසත් වූ හෝ පැහැර හරින ලද අවස්ථාවකදී,

ලියාපදිංචිය අවලංගු කළ බව දැන්වීම

19. මෙම ප්‍රඥප්තියේ 18 වන වගන්තිය ප්‍රකාර යම් ළමා නිවාසයක ලියාපදිංචි අවලංගු කළ යුතු යැයි කොමසාරිස්වරයා විසින් තීරණය කළ වහාම ඒ බව කොමසාරිස්වරයා විසින් ළමා නිවාසයේ කළමනාකරු වෙත ලියාපදිංචි තැපෑලෙන් දැන්විය යුතුය.

(අ) නැතහොත් අදාළ ළමා නිවාසය භාර අධීක්ෂණ පරිවාස නිලධාරියා මගින් භාර දීමට ක්‍රියා කළ යුතුය.

(ආ) නිවාසයේ යම් ගොඩනැගිල්ලක කැපී පෙනෙන ස්ථානයක දැන්වීමක් ඇලවීම මගින් ලිඛිතව ප්‍රදර්ශනය කළ යුතුය.

අභියාචනා ඉදිරිපත් කිරීම

20. (1) ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ සඳහන් කොමසාරිස්වරයාගේ තීරණයට එම ළමා නිවාසයේ පාලක මණ්ඩලය එකඟ නොවන අවස්ථාවකදී ඒ තීරණය දිනයේ සිට දින දාහතරක් ඇතුළත කළමණාකරු විසින් මීට අදාල අභියාචනයක් කොමසාරිස්වරයාට පිටපතක් සහිතව ලේකම්වරයා වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කල හැකිය.

(2) ඉහත 1 වන උප වගන්තියේ ප්‍රකාර අභියාචනයක් ඉදිරිපත් කළ අවස්ථාවක ඊට ලේකම්වරයාගේ තීරණය ලැබෙන තෙක් ළමා නිවාසය පවත්වා ගෙන යාමට අදාලව පාලක මණ්ඩලයට බලය ඇත්තේය.

ලේකම්ගේ තීරණය

21. (1) මෙම ප්‍රඥප්තියේ 20 වන වගන්තිය ප්‍රකාර අභියාචනා ලද පසු ලේකම්වරයා විසින් පත්කරනු ලබන කොමසාරිස්වරයාට සමාන හෝ ඊට ඉහළ තනතුරක් දරන නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් මගින් කරනු ලබන පරීක්ෂණයකින් පසුව පහත සඳහන් ක්‍රියාමාර්ගවලින් එකක් ගත යුතුය.

(අ) ලියාපදිංචි වලංගු කිරීම සක්‍රීය කිරීම

(ආ) ලියාපදිංචි අවලංගු කිරීම තහවුරු කිරීම

(ඇ) කොමසාරිස්වරයාගේ තීරණය සම්බන්ධයෙන් ලේකම්වරයා විසින් නියම කරනු ලබන කොන්දේසි සපුරන තෙක් ලියාපදිංචිය අවලංගු කිරීම උපරිම වශයෙන් මාස තුනකට කල් දැමීම.

(2) (අ) ඉහත 20 (1) වන උප වගන්තිය යටතේ ලේකම්වරයා විසින් නියම කරනු ලබන අභියාචනය ලැබුන දිනයේ සිට මාස එකක් ඇතුලත කළමනාකරු වෙත කොමසාරිස්වරයාට පිටපතක් සහිතව ලේකම්වරයා විසින් ලිඛිතව දැන්විය යුතුය.

(ආ) ඉහත පළමුවන උප වගන්තියේ (ඇ) අනුවගන්තිය යටතේ ළමා නිවාසය වෙත ලබා දෙන ලද කාල සීමාව ඉක්මවීමෙන් පසු ලේකම්වරයා විසින් නැවත පරීක්ෂණයක් පවත්වා ලියාපදිංචිය අවලංගු කිරීම තහවුරු කිරීම හෝ ලියාපදිංචි වලංගු කිරීම සක්‍රිය කිරීම කල හැකිය.

ලියාපදිංචිය අවලංගු කළ අවස්ථාවකදී ගත යුතු පියවර

22. මෙම ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ පළමුවන උප වගන්තියේ (ආ) ඡේද ප්‍රකාරව ලියාපදිංචිය අවලංගු කළ ළමා නිවාසයක සිටින සියළුම නේවාසික ළමුන් දෙමාපියන් හෝ භාරකරුවන් වෙත භාර දීම, ස්ත්‍රී, පුරුෂ භාවය, ජාතිය අනුව සහ ආගම ඇදහීමේ පහසුකම් ඇති වෙනත් ලියාපදිංචි ළමා නිවාසයකට මාරුකිරීම කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ පරිවාස නිලධාරියෙකු විසින් කළ යුතුය.

ලියාපදිංචිය අවලංගු කළ ළමා නිවාසයක වත්කම් පැවරීම

23. ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ ළමා නිවාසයකට රජය මගින්, ස්වේච්ඡා සංවිධාන මගින් ආයතන මගින්, පුද්ගලයින් මගින් ලබා දී ඇති ජංගම හා ස්ථාවර වත්කම් කොමසාරිස්වරයා විසින් දෙපාර්තමේන්තුව භාරයට ගැනීම හෝ කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන වෙනත් ලියාපදිංචි ළමා නිවාසයකට පැවරීම කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් ඒ සඳහා නිශ්චිතව බලය පවරනු ලැබූ ස්ථානභාර පරිවාස නිලධාරියෙකු විසින් කටයුතු කළ යුතුය.

පාලන මණ්ඩලයේ සංයුතිය හා සුදුසුකම්

24. (1) ළමා නිවාසය සඳහා පාලක මණ්ඩලය පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය.

(අ) පාලක මණ්ඩලය සභාපති,
(ආ) උපසභාපති,
(ඇ) ලේකම්,
(ඈ) උප ලේකම්,
(ඉ) භාණ්ඩාගාරික,
(ඊ) ළමා නිවාසයේ කළමනාකරු,
(උ) කාරක සභිකයන් හත් දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(2) පාලක මණ්ඩලයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික සහ ළමා නිවාසයේ කළමනාකරු ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(3) ළමා නිවාසයේ කළමනාකරු සහ අවම වශයෙන් පාලක මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනෙකු සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.

(4) ළමා නිවාසයේ පාලක මණ්ඩලය සහ කළමනාකරු යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් හෙබි, අධිකරණය මගින් සාපරාධී වරදකට දඬුවම් ලැබූ අයකු නොවිය යුතුය.

ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කළ යුතු බව හා ඒවා පිළිපැදිය යුතු බව

25. ළමා නිවාසයක සේවා තත්ත්වය නගා සිටුවීම සඳහා ප්‍රමිතීන් වරින්වර අමාත්‍යවරයා විසින් නියෝග මගින් පැනවිය යුතුය.

බාහිර නිල පිරික්සුම් මඬුල්ලක් පත් කිරීම

(1) පළාත තුළ පිහිටි සෑම ස්වේච්ඡා ළමා නිවාසයකටම බාහිර නිලපිරික්සුම් මඬුල්ලක් පත් කළ යුතුය. එය අදාල අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව පළාත් කොමසාරිස් විසින් පත් කළ යුතුය.

(2) එම පිරික්සුම් මණ්ඩලය පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත විය යුතුය. පිරික්සුම් මණ්ඩලය පත් කිරීමේදී, එහි සාමාජිකයින් ගණන අවමය තිදෙනෙකු හෝ උපරිමය පස් දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

i. ළමා නිවාසය පිහිටි ප්‍රදේශය භාර පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා.
ii. ළමා නිවාසය පිහිටි ප්‍රදේශය භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා.
iii. ළමා නිවාසය පිහිටි ග්‍රාම නිලධාරි වසමේ ග්‍රාම නිලධාරීවරයා.
iv. ළමා නිවාසය පිහිටි කොට්ඨාසය භාර පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය.
v. ළමා නිවාසය පිහිටි කොට්ඨාසය භාර ආර්ථික සංවර්ධන නිලධාරී.

(3) බාහිර නිල පිරික්සුම් මණ්ඩලය පත් කළ පසු ඔවුන්ට මෙම ප්‍රඥප්තිය 30 වන වගන්තිය මගින් පරීක්ෂකවරයෙකු මත පවරා ඇති බලතල ක්‍රියාත්මක කළ හැකිය.

26. ළමා නිවාසයේ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් වූ සියළුම කාර්යයන් ද ළමා නිවාසය වෙනුවෙන් ක්‍රියාත්මක කරන වෙනත් කාර්යයන්ද සම්බන්ධයෙන් කොමසාරිස් සමග කරනු ලබන සියළුම ලිපි ගනුදෙනු ඒ ළමා නිවාසයේ කළමනාකරු විසින් පමණක් කළ යුතුය.

## *III* කොටස

### ළමයින් ළමා නිවාස වලට ඇතුළත් කිරීම, අධීක්ෂණය කිරීම, ස්ථාපනය කිරීම, පාලක මණ්ඩලය බල රහිත කිරීම

ළමා නිවාසයකට ළමුන් ඇතුළත් කිරීම

27. (1) කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව මිස මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි ළමා නිවාසයකට කිසිම ළමයෙකු ඇතුළත් නොකළ යුතුය. එසේ වුවද සාධාරණ හේතු මත කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය නැතිව ළමයෙකු ලියාපදිංචි ළමා නිවාසයකට ඇතුළත් කිරීමට පාලක මණ්ඩලයට හැකිය. එසේ ඇතුලත් කර ගත හැකි ළමුන් සංඛ්‍යාව ළමා නිවාසයකට අනුමත ළමුන් සංඛ්‍යාවෙන් 10%ක් නොඉක්මවිය යුතුය. එසේ වුවත් ඇතුළත් කරනු ලබන ළමයින් සම්බන්ධයෙන් සතියක් ඇතුළත දී කොමසාරිස්වරයාගේ පූර්ණ අනුමැතිය ලබා ගත යුතුය.

(අ) යම් ළමා නිවාසයකට ළමුන් ඇතුළත් කිරීමේදී, කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබ ඇති වයස් සීමාවට, ස්ත්‍රී පුරුෂ භාවයට හෝ ආගමික වර්ගීකරණයට පටහැනිව කිසිම ළමයෙකු කිසිම තැනැත්තෙකු විසින් ළමා නිවාසයට ඇතුළත් නොකල යුතුය.

(ආ) යම් ළමා නිවාසයකට විශේෂිත අවස්ථාවකදී ළමයාගේ උපරිම යහපත වෙනුවෙන් ඉහත 27(1) අ අනු වගන්තියේ ඇතුළත් විධිවිධාන නොසලකා ළමුන් ඇතුළත් කිරීමට කොමසාරිස්වරයාට බලය ඇත.

(ඇ) අධිකරණය මගින් යොමුකරනු ලබන්නාවූ අවුරුදු දහ අටට අඩු වයසේ සිටින ගර්භණීභාවයට පත්වූ ළමා මව්වරුන්ට හා ඔවුන්ගේ දරුවන්ට භාරය, ආරක්ෂාව හා රැකවරණය සැලසීම සඳහා අධිකරණයේ භාරයට පත්වීමට පෙර සිදුවූ සිදුවීම් හා මානසික අසමතුලිතතාවය පදනම් කර ගනිමින් ළමා නිවාසයක් සඳහා ළමුන් ඇතුළත් කළ හැකිය.

ස්ථාපනය කිරීම හා උපදෙස් පිළිපැදිය යුතු බව

28. ලියාපදිංචි ළමා නිවාසයක් යම් ළමයෙකු ස්ථාපනය කිරීම පිළිබඳව සහ ළමුන්ගේ සුභසිද්ධියට අදාලව කළ යුතු කටයුතු සම්බන්ධව කොමසාරිස්වරයා විසින් හෝ ස්ථානභාර පරිවාස නිළධාරිවරයා විසින් හෝ ළමා නිවාසය අධීක්ෂණය භාරව කටයුතු කරන පරිවාස නිළධාරි විසින් දෙනු ලබන උපදෙස් හා නියමයන් පිළිපැදීමටත් ඉටු කිරීමටත් ළමා නිවාසයේ කළමණාකරු, පාලක මණ්ඩලය සහ කාර්යය මණ්ඩලය කටයුතු කළ යුතුය.

එක් එක් ළමයා පිළිබඳ වාර්තාවක් පිළියෙළ කළ යුතු බව

29. යම් ළමා නිවාසයක් ලියාපදිංචි කර පවත්වාගෙන යාමේදී ඒ ළමා නිවාසයේ නේවාසික ළමයින් අනාථ, අත්හල හා අසරණ හෝ අපයෝජනයට ලක්වූ ගනයට අයත් වේදැයි පරීක්ෂා කර බලා එක් එක් ළමයා වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් සකස් කරනු ලැබූ විධිමත් නිර්දේශ වාර්තාවක් එම ළමා නිවාසය සම්බන්ධයෙන් වාර්තා සපයනු ලබන පරිවාස නිළධාරි විසින් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

ළමා නිවාස අධීක්ෂණය

30. ඒ ඒ ළමා නිවාසයේ අධීක්ෂණයට පරිවාස නිළධාරියෙකු පත් කළ යුතුය. කොමසාරිස්වරයාට ළමා නිවාසය අධීක්ෂණය භාර පරිවාස නිළධාරීට, ස්ථානභාර පරිවාස නිළධාරීට හා කොමසාරිස් විසින් බලය පවරනු ලබන නිළධාරියෙකුට ඕනෑම වේලාවක ළමා නිවාසයට පිවිස පරීක්ෂා කල හැකිය. එවැනි පරීක්ෂණයකට ළමා නිවාසයේ පාලක මණ්ඩලය කාර්යය මණ්ඩලය සහ වෙනත් කිසිම පුද්ගලයෙකු අවහිර නොකළ යුතුය.

නේවාසික පහසුකම් සැපයීම

31. (1) ළමා නිවාසයක් ලියාපදිංචි කිරීමේදී එහි නේවාසිකව සිටින ළමුන් තවදුරටත් රඳවා ගැනීම හා ස්ථාපනය කිරීම කොමසාරිස්වරයාගේ අනුමැතිය අනුව කළ යුතුය.

(2) මෙම ප්‍රඥප්තියේ 29 වන වගන්තිය යටතේ යම් වාර්තාවක කරුණු අනුව ඒ ළමා නිවාසයේ නේවාසික ළමුන් අනාථ, අත්හල, අසරණ සහ අපයෝජනයට ලක්වූ ගනයට අයත් වන අවස්ථාවදී කොමසාරිස්වරයා වෙත පූර්ව දැනුම් දීමක් කොට ඒ ළමයින් ඇතුළත් කල දින සිට අවුරුදු එකක උපරිම කාලයක් දක්වා ඒ නිවාසයේ තබා ගත හැකිය. එසේ වුවද අවශ්‍යතාවය අනුව කොමසාරිස්වරයාට එකී කාලය වෙනස් කළ හැකිය.

(3) මෙම ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ සඳහන් වාර්තා පදනම් කරගෙන කොමසාරිස්වරයා විසින් අනාථ, අත්හල, සහ අපයෝජනයට ලක්වූ ගනයට අයත් නොවන බවට නිගමනය කරනු ලබන ළමයින් ඔහු විසින් නියම කරනු ලබන ආකාරයට එසේ නියම කළ දින සිට මාස තුනක් ඇතුළත ස්ථාපනය කිරීමට කළමනාකරු විසින් කටයුතු කළ යුතුය.

තොරතුරු හා වාර්තා ලබා දීම

32. කොමසාරිස්වරයාගේ හෝ ස්ථානභාර පරිවාස නිළධාරීගේ හෝ අධීක්ෂණය භාර පරිවාස නිළධාරීගේ හෝ ලිඛිත දැන්වීමක් මගින් ඉල්ලා සිටින තොරතුරු හා වාර්තා ඒ දැනුම් දීමේ සඳහන් කාලය ඇතුළත නිවැරදිව ලබා දීමට කළමනාකරු කටයුතු කළ යුතුය.

නිසි බලධාරියෙකු පත් කිරීම

33. යම් ළමා නිවාසයක කළමනාකරු හෝ පාලක මණ්ඩලය හෝ කාර්යය මණ්ඩලය 28 වන වගන්තිය යටතේ දෙන ලද උපදෙස් නොපිළිපදින හා නියම ඉටු නොකරන අවස්ථාවකදී හෝ 32 වන වගන්තියේ සඳහන් තොරතුරු හෝ වාර්තා ඉදිරිපත් නොකරන අවස්ථාවකදී යම් ළමා නිවාසයක කළමනාකරණය හා පාලක මණ්ඩලය බල රහිත කොට ළමා නිවාසය පවත්වා ගෙන යාම සඳහා නිසි බලධාරියෙකු පත් කිරීමට කොමසාරිස් වරයාට බලය ඇත.

34. (1) ඉහත 33 වගන්තියේ විධිවිධාන ආකාරව කොමසාරිස්වරයා විසින් ළමා නිවාසයක පාලක මණ්ඩලය බල රහිත කිරීමට කටයුතු කරන අවස්ථාවකදී පළාත් රාජ්‍ය සේවයට ඇතුළත් මාණ්ඩලික නිළධාරියෙකු එකී ළමා නිවාසයේ නිසි බලධාරියා වශයෙන් පත් කිරීමට පියවර ගත යුතුය.

(2) නිසි බලධාරියෙකු යටතේ ළමා නිවාසය පවත්වාගෙන යාම සඳහා වන මූලික වියදම් පළාත් සභා අරමුදලට වැය බරක් වන්නේය.

කළමනාකරු හෝ පාලක මණ්ඩලය ළමා නිවාසයේ කටයුතු වලට මැදිහත් නොවිය යුතු බව

35. (1) කොමසාරිස්වරයා විසින් 33 වන වගන්තිය යටතේ ළමානිවාසයක් සම්බන්ධව නිසි බලධාරියෙකු පත් කිරීමෙන් පසු,

(අ) ළමා නිවාසයේ පාලක මණ්ඩලය කළමනාකරු සහ කාර්යය මණ්ඩලය එහි කිසිම කටයුත්තකට සහභාගි වීම හෝ සම්බන්ධ වීම නොකළ යුතුය.

(ආ) කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කළමනාකරු, පාලක මණ්ඩලයේ කිසිවකු හෝ කාර්යය මණ්ඩලයේ කිසිවකු ඒ ළමා නිවාසය පිහිටි පරිශ්‍රයට සහ ගොඩනැගිල්ලකට කිසිදු අයුරකින් ඇතුල් නොවිය යුතුය.

වත්කම් භාරදීම

36. මෙම ප්‍රඥප්තියේ 33 වන වගන්තිය යටතේ නිසි බලධාරියෙකු පත් කළ අවස්ථාවකදී ඒ බව කොමසාරිස්වරයා විසින් කළමනාකරු වෙත ලිඛිතව දැන්විය යුතු අතර, එම ලිපිය ලැබූ වහාම එම ළමා නිවාසයේ කළමනාකරු හෝ පාලක මණ්ඩලය හෝ අධිකාරි බලය ඇති අය හෝ හිමිකරු හෝ කාර්යය මණ්ඩලය විසින් හෝ ළමා නිවාසයේ සියලු ලිපි ලේඛණ නිශ්චල හා චංචල දේපළ සමග ආයතනයේ භුක්තිය නිසි බලධාරියා වෙත විධිමත්ව භාර දිය යුතුය.

නව පාලක මණ්ඩලයක් හා කළමනාකරුවකු පත් කිරීම

37. (1) බල රහිත කරන ලද පාලක මණ්ඩලය සහ කළමනාකරු වෙනුවට නව පාලක මණ්ඩලයක් හා කළමනාකරුවකු පත් කිරීම නිසි බලධාරියා පත් කළ දින සිට මාස තුනක් ඇතුළත දී කොමසාරිස්වරයාගේ අධීක්ෂණය යටතේ සිදු කළ යුතුය.

(2) නව පාලක මණ්ඩලය හා කළමනාකරුවෙකු පත් කර ගැනීම සඳහා ළමා නිවාසය පවත්වා ගෙන ගිය සංවිධානයේ සියළුම සාමාජිකයින්ට රැස්වන ලෙස කොමසාරිස්වරයා විසින් ලිඛිතව දන්වා යැවිය යුතුය. එහිදී රහස් ඡන්දයක් මගින් කළමනාකරුවෙකු හා පාලක මණ්ඩලයක් පත් කර ගත යුතුය.

(3) නව කළමනාකරු හා පාලක මණ්ඩලය පත් කිරීමේදී හිටපු කළමනාකරු හෝ පාලක මණ්ඩලය නැවත පත් කර නොගත යුතුය.

(4) මෙම වගන්තියේ දෙවන උප වගන්තය යටතේ පත් වන කළමනාකරුට ළමා නිවාසයේ සියලුම ලිපි ලේඛණ නිශ්චල හා චංචල දේපල සමග භුක්තිය ඔහු පත්වී දින හතක් ඇතුළතදී නිසි බලධාරියා විසින් භාර දිය යුතුය. එසේම භාරගත් දින සිට ළමා නිවාසය පවත්වා ගෙන යාමට නව කළමනාකරුට හා පාලක මණ්ඩලයට බලය ලැබෙන්නේය.

(5) පළමුවන උප වගන්තිය අනුව කටයුතු ඉටු කර ගැනීමට කොමසාරිස්වරයාට අවකාශ නොලැබී ගියහොත් එය ඉටු කර ගන්නා තෙක් ඉහත දක්වා ඇති තුන් මසක කාලය ඉක්මවා ළමා නිවාසය නිසි බලධාරියා මගින් පවත්වා ගෙන යාම සඳහා එම ළමා නිවාසයේ ළමුන් ස්ථාපනය කිරීමේ බලය කොමසාරිස්වරයා සතුවේ.

## *IV* වන කොටස

### භාර ගැනීමේ ළමා නිවාස

පළාත් සභාව සතු ළමා නිවාස තිබිය යුතු බව

38. වයස අවුරුදු පහට අඩු අනාථ, අත්හල, අසරණ සහ අපායෝජනයට පත්වූ ළමුන් නේවාසිකව රැකබලා ගැනීම සඳහා පළාත් භාර ගැනීමේ ළමා නිවාසයන් තිබිය යුතු අතර, ඒවා පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පාලනයට යටත් විය යුතුය.

භාර ගැනීමේ ළමා නිවාසයකට ඇතුළත් කල යුතු බව

39. (1) අවුරුදු පහට අඩු ළමයෙකු අනාථ වී ඇති බව හෝ අත්හරිනු ලැබ ඇති බව වාර්තා වූ විට කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු එම ළමයා පළාතේ භාර ගැනීමේ ළමා නිවාසයකට ඇතුළත් කිරීමට පරිවාස නිළධාරීන් පියවර ගත යුතුය.

රෝහලට ඇතුළත් කළ යුතු බව

(2) මෙම වගන්තියේ පළමු උප වගන්තියට අයත් ළමයෙකු අපයෝජනයට ලක් වී ඇත්නම් ඒ සම්බන්ධයෙන් අධිකරණ ආඥාවක් අවශ්‍ය වන අවස්ථාවකදී ඒ බව අදාළ පොලිසියට දැන්වීමට අරෝග්‍ය ශාලාව භාර වෛද්‍ය නිළධාරීන් විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් යම් නිළධාරියෙකු විසින් කටයුතු කළ යුතුය.

උපත ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම

40. ආරෝග්‍ය ශාලාවක උපත ලැබීමෙන් පසු අනාථ වන හෝ අත්හරිනු ලබන හෝ සෑම ළමයෙකුගේම උපත ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් මූලික කටයුතු ආරෝග්‍ය ශාලාව භාර වෛද්‍යවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් යම් නිළධාරියෙකු විසින් හෝ ළමයා රෝහලින් මුදා හැරීමට ප්‍රථම කළ යුතුය.

පරීක්ෂණ වාර්තාවක් ලබා දිය යුතු බව

41. පළාත් භාර ගැනීමේ ළමා නිවාසයට ඇතුළත් කරනු ලබන සෑම ළමයෙකු පිළිබඳව සම්පූර්ණ විස්තර සහිත වාර්තාවක් කොමසාරිස් විසින් අධිකරන කලාප භාර පරිවාස නිළධාරියෙකුගෙන් හෝ කොමසාරිස් විසින් බලය පවරනු ලබන කොට්ඨාසයේ වෙනත් පරිවාස නිළධාරියෙකුගෙන් ලබා ගත යුතුය. එසේම පළාත් භාර ගැනීමේ ළමා නිවාසයට ඇතුළත් කරනු ලබන සෑම ළමයෙකු පිළිබඳවම සම්පූර්ණ විස්තර සහිත වාර්තාවක් ඒකකය භාර ස්ථානභාර පරිවාස නිළධාරි විසින් ළමයා ඇතුළත් කළ දින සිට දින 30 ක් ඇතුළත කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය.

42. පළාතේ ළමා නිවාසයන්ට ඇතුලත් කරනු ලබන ළමයින්ගේ ස්ථාපන කටයුතු කොමසාරිස්වරයා විසින් කළ යුතුය. ඒ සඳහා ඔහුට ස්ථාපන කමිටුවේ සහාය ලබා ගත හැකිය. ස්ථාපන කටයුතු කිරීම

43. මෙම ප්‍රඥප්තියේ 38 වන වගන්තිය අනුව පිහිටවනු ලබන පළාත් භාර ගැනීමේ ළමා නිවාසයේ කාර්යයන් සඳහා කාර්යය මණ්ඩලයක් සිටිය යුතුය. පළාත් භාර ගැනීමේ ළමා නිවාසයේ කාර්යය මණ්ඩලයක් සිටීම

## V වන කොටස

### වැරදි හා දණ්ඩන

44. ළමා නිවාසයක කළමනාකරු විසින් හෝ පාලක මණ්ඩලයේ යම් තැනැත්තෙකු විසින් හෝ කාර්යය මණ්ඩලයේ යම් තැනැත්තෙකු විසින් ළමා නිවාසයක හෝ පළාතේ භාරගැනීමේ ළමා නිවාසයක සිටින කිසිම ළමයෙකු අපයෝජනය හෝ අපහරනය කිරීම හෝ ඒ සඳහා යම් කෙනෙකුට සහය වීම හෝ අනුබලය දීම හෝ අවකාශ සැලසීම හෝ ඉඩ හැරීම හෝ වරදක් වන්නේය. එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලද ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබුවහොත් රු.5,00,000.00 කට (ලක්ෂ පහක) නොවැඩි දඩයකට හෝ වසර පහක් (05) ක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතුය. අපයෝජනය හෝ අපහරනය නොකළ යුතු බව

45. (1) ලියාපදිංචි කිරීමට පෙර හෝ ලියාපදිංචි කිරීමෙන් පසුව හෝ යම් ළමා නිවාසයක කළමනාකරු විසින් හෝ පාලක මණ්ඩලයේ යම් තැනැත්තෙකු විසින් හෝ මෙම ප්‍රඥප්තිය යටතේ කරනු ලැබ ඇති යම් නියමයක් අනුව යම් වාර්තාවක් හෝ තොරතුරක් සැපයීම පැහැර හැරීම හෝ තමා විසින් සපයනු ලබන යම් වාර්තාවකට හෝ තොරතුරකට දැන දැනම අසත්‍ය ප්‍රකාශයක් ඇතුළත් කිරීම හෝ මෙම ප්‍රඥප්තිය යටතේ යම් වරදක් සඳහා විශේෂ දණ්ඩනයක් නියම කරමින් විධි විධාන සලසා නොමැති අවස්ථාවක ඒ වරද කරන සෑම තැනැත්තෙක්ම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙන් පවත්වන ලද ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබුවහොත් රුපියල් පන්දහසකට නොඅඩු රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට යන දෙආකාරයකින් එක් ආකාරයකට බන්ධනාගාර ගත කිරීම හෝ දඩය හා බන්දනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතුය. වරදක් කරනු ලබන බව හා දණ්ඩනය

46. ලියාපදිංචි කිරීමේ බලපත්‍රයක් නොමැතිව ළමා නිවාසයක් පවත්වාගෙන යාම මෙම ප්‍රඥප්තිය යටතේ සිදු කරනු ලබන වරදක් වන්නේය. එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු වන සෑම තැනැත්තෙකුම රුපියල් පන් දහසකට නොඅඩු රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොඅඩු වසරකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීම හෝ එකී දඬුවම් දෙකකට හෝ යටත් විය යුතුය.

47. පුද්ගල මණ්ඩලයක් විසින් ප්‍රඥප්තිය යටතේ වරදක් කරනු ලැබූ විට,

(1) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම් ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයෙකුම හා නිළධාරියෙක්ම

(2) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම් ඒ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවෙකුම

(3) ඒ පුද්ගල මණ්ඩලය ළමා නිවාසය පාලනය කරන පාලක මණ්ඩලයක් නම් එහි සෑම සාමාජිකයෙකුම,

ඒ වරදට වරදකරු වන්නේය. එසේ වුවද එම වරද සිදු කරන ලද්දේ තමාගේ දැනුම නොමැතිව හෝ මෙම වරද සිදු කිරීම වැලැක්වීම සඳහා තමා නිසි සියළු උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව ඒ සංස්ථාවේ අධ්‍යක්ෂ වරයෙකු විසින් හෝ නිළධාරිවරයෙකු විසින් හෝ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවෙකු විසින් හෝ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු විසින් හෝ ඔප්පු කරනු ලැබුවහොත් ඔහු එම වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතුය.

48. ළමා නිවාසයක කළමනාකරු හෝ පාලක මණ්ඩලයේ තැනැත්තෙකු හෝ කාර්යය මණ්ඩලයේ තැනැත්තෙකු හෝ මෙම ප්‍රඥප්තිය යටතේ අධිකරණයේදී දඬුවම් ලැබුවහොත් ඒ තැනැත්තාට හෝ තැනැත්තන්ට ඉන් පසුව සබරගමුව පළාත තුළ කිසිදු ළමා නිවාසයක පාලක මණ්ඩලයක කාර්යය මණ්ඩලයක නිලයක් තනතුරක් සහ කළමනාකාර තනතුරක් දැරිය නොහැකිය.

## *VI* වන කොටස

### මුදල්

අරමුදල් සැපයීම

49. (1) මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද ආයතන වල නඩත්තුව උදෙසා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සපයා දීම හා වැය කිරීම සම්බන්ධයෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන අදාළ වන්නේය.

(2) මධ්‍යම රජය මගින් හෝ වෙනත් නිත්‍යානුකූල මූල්‍ය ප්‍රභවයක් මගින් හෝ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට ලබා දෙන අරමුදල් ද මේ ප්‍රඥප්තියේ කටයුතු කිරීම සඳහා යොදා ගත හැකිය.

50. (1) සබරගමුව පළාතේ ළමාරක්ෂක සේවා අරමුදලක් පිහිටුවීම කළ හැකි අතර, එම අරමුදලට පහත සඳහන් මුදල් බැර කළ හැකිය.

(අ) දේශීය හා විදේශීය යම් පුද්ගලයෙකු, සංවිධානයක් හා ආයතනයක් මගින් උපයා ගන්නා ලද මුදල්

(ආ) සංදර්ශන ලොතරැයි හා වෙනත් සම්මත මූල්‍ය ප්‍රභවයන් මගින් ලබා ගන්නා ලද මුදල්

(ඇ) පළාත් සභා පනතේ 22 වන වගන්තිය යටතේ රජය මගින් ලබා දෙන විදේශීය ආධාර වශයෙන් ලැබෙන මුදල්

(ඈ) පළාත් සභාවේ වාර්ෂික අයවැය ලේඛණය මගින් ප්‍රදානයන් වශයෙන් ලබා දෙන මුදල්

(2) 50 (1) සඳහන් අරමුදලේ මුදල් වියදම් කිරීම සම්බන්ධව හා ගිණුම් පවත්වා ගෙන යාම සම්බන්ධව අමාත්‍යවරයා විසින් වරින් වර නියෝග පැන විය හැකිය. මෙම අරමුදලේ ගිණුම් 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ තුන්වන කොටසේ විධිවිධාන වලට අනුකූල විය යුතුය.

අරමුදලේ ගිණුම හා ගිණුම් විගණනය

(3) රාජ්‍ය ආයතනවල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තියේ විධිවිධාන හා සබරගමුව පළාත් සභා මුදල් රීති මෙම අරමුදල් ගිණුමේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් ද අදාළ විය යුතුය.

අරමුදල් ගිණුම් පිළිබඳ වාර්තාව

(4) අමාත්‍යවරයා විසින් ලිත් වර්ෂය අවසන් වී මාස නවයක් ඇතුළත එක් එක් ලිත් වර්ෂය සඳහා වූ අරමුදල් ගිණුමේ පරිපාලනය සඳහා වූ වාර්තාවක්ද සමග එම අරමුදල් ගිණුමේ විගණනය කරන ලද එම වර්ෂයේ ගිණුම් වල පිටපතක්ද එම ගනන් පිළබඳ විගණකාදිපතිවරයාගේ වාර්තාව සමග සබරගමුව පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලය හා සබරගමුව පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

## *VII* වන කොටස

### පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සංයුතිය හා බලතල

කාර්යය මණ්ඩලය

51. කොමසාරිස්වරයාට සහය පිණිස නියෝජ්‍ය හා සහකාර කොමසාරිස්වරුන්, ජ්‍යෙෂ්ඨ පරිවාස නිළධාරීන් ස්ථානභාර පරිවාස නිළධාරීන්, පරිවාස නිළධාරීන් ඇතුළු ධූරයක් තිබිය යුතුය.

කොමසාරිස් කාර්යාලයක් තිබිය යුතු බව

52. මෙම ප්‍රඥප්තියේ කාර්යයන් ඉටුකිරීම සඳහා පළාත් කොමසාරිස් කාර්යාලයක් තිබිය යුතු අතර, එම කාර්යාලය ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයකින් හා පහසුකම් වලින් සමන්විත විය යුතුය.

නඩත්තු ආධාර ගෙවීම

53. (1) මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලබන ළමා නිවාසයක රැකවරණය ලබන ළමයෙකු වෙනුවෙන් වාර්ෂිකව ගනණය කරනු ලබන නඩත්තු ආධාර මුදලක් ගෙවිය හැකිය.

(2) මෙම නඩත්තු ආධාර මුදල් කලින් කලට ප්‍රතිශෝධනය කිරීමේ බලය විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත පළාත් අමාත්‍ය මණ්ඩලය සතු වන්නේය. ළමා නිවාසයක් ලියාපදිංචි කළ දිනයේ සිට මාස හයක් ගත වන තෙක් නඩත්තු ආධාර ලැබීම සඳහා හිමිකමක් නොමැත.

(3) ළමා නිවාසයක් පවත්වා ගෙන යනු ලබන රාජ්‍ය නොවන සංවිධානයක, අර්ධ රාජ්‍ය ආයතනයක හා රාජ්‍ය ආයතනයක මහා සභා රැස්වීමකදී හෝ අයවැය ලේඛණයකදී බහුතරයකගේ ඡන්දයෙන් වාර්ෂිකව පත් කරනු ලබන කළමනාකරු හෝ කළමණාකරු විසින් ළමා නිවාසයට අදාළව වාර්ෂිකව ගිණුම් ප්‍රකාශයක් සකස් කළ යුතු අතර, කළමනාකරු විසින් එම ප්‍රකාශය කොමසාරිස්වරයා වෙත සෑම වසරකම ජනවාරි 15 දිනට පෙර ඉදිරිපත් කළ යුතුය.

54. (1) මෙම ප්‍රඥප්තියට අදාළ නියෝග පැනවීමට අමාත්‍යවරයාට බලය ඇත. නියෝග

(2) අමාත්‍යවරයා විසින් පනවන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. පළාත් සභාව විසින් අනුමත කිරීම හෝ නොකර සිටීම ගැසට් පත්‍රයක් මගින් නිවේදනය කළ යුතු අතර, අමාත්‍යවරයා විසින් පනවන ලද නියෝගයක් පළාත් සභාව විසින් අනුමත නොකළ අවස්ථාවකදී එම නියෝගයට අදාළව ඊට ප්‍රථම කරන ලද ක්‍රියාවකට අගතියක් නොවන පරිදි ඒ නියෝගය අවලංගු වන්නේය.

55. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය. සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

56. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස අර්ථ නිරූපනය

"අනාථ" යන්නෙන් නීත්‍යානුකූලව විවාහ වූ දෙමාපියන්ට උපන් ළමයෙක් නම් දෙමාපියන් දෙදෙනා මියගිය හෝ නීත්‍යානුකූලව විවාහ නොවූ දෙමාපියන්ට උපන් ළමයෙක් නම් මව මිය ගිය ළමයෙකු අදහස් වේ.

"අත්හල" යන්නෙන් නීත්‍යානුකූලව විවාහ වූ දෙමාපියන්ට උපන් ළමයෙක් ඔවුන් දෙදෙනා විසින් අත්හල හෝ නීත්‍යානුකූලව විවාහ නොවූ දෙමාපියන්ට උපන් ළමයෙක් නම් මව විසින් අත්හල ළමයෙකු අදහස් වේ.

"අසරණ" යන්නෙන් මව හෝ පියා හෝ මියගිය දෙමාපියන්ගෙන් එක් අයෙකු විසින් අත්හැර දමනු ලැබ හා අනෙක් තැනැත්තා දෙමාපියෙකු ලෙස කටයුතු කළ නොහැකි, භාරය හා ආරක්ෂාව අවශ්‍ය රජයේ දෙපාර්තමේන්තුවක් මගින් හෝ පළාත් පාලන ආයතනයක් මගින් ප්‍රදානය කරනු ලබන මහජන සහනාධාර ලබන දෙමාපියන්, දෙමාපියන්ගෙන් කෙනෙකු වෛද්‍ය සහතිකයක් අනුව ආදායම් මාර්ගයන් ලබා ගත නොහැකි රෝගී තත්ත්වයක සිටින හා අනෙක් තැනැත්තා/තැනැත්ති (මව හෝ පියා හෝ) ස්ථිර ආදායම් මාර්ගයක් නැති, දෙමාපියන්ගෙන් කෙනෙකු බන්ධනාගාර ගතව සිටින හා අනෙක් තැනැත්තා/තැනැත්ති (මව හෝ පියා හෝ) ස්ථිර ආදායම් මාර්ගයක් නැති දෙමාපියන්ගෙන් කෙනෙකු වෛද්‍ය සහතිකයක් මත මානසික රෝගියෙකු යැයි නිශ්චය කර ඇති සහ අනෙක් තැනැත්තාට/තැනැත්තිට (මව හෝ පියා හෝ) ස්ථිර ආදායම් මාර්ගයක් නැති, උසාවි නියෝගයක් මත හෝ වෙනත් ආකාරයකින් දෙමාපියන් වෙන්වූ පවුලක ළමුන්ගේ භාරකාරත්වය දරන මවට හෝ පියාට හෝ ස්ථිර ආදායම් මාර්ගයක් නැති ළමයෙකු අදහස් වේ.

"අපයෝජනය" යන්නෙන්

(අ) දණ්ඩ නීති සංග්‍රහයේ 286 අ, 288, 288අ, 308අ, 360අ, 360ආ, 360ඇ, 363, 364අ, 365අ හා 365ආ වගන්ති වල කවර හෝ විධිවිධානයක්.

(ආ) ස්ත්‍රී තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ පනතේ කවර හෝ විධිවිධානයක්.

(ඇ) ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනතේ කවර හෝ විධිවිධානයක්.

(ඈ) අධ්‍යාපනික ආඥා පනත යටතේ සාදන ලද අනිවාර්යය අධ්‍යාපනයට අදාළ නියෝග වල කවර හෝ විධිවිධානයක් අදහස් වේ.

"පළාත් සභාව" යන්නෙන් සබරගමුව පළාත් සභාව අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් සබරගමුව පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක සේවා විෂයභාර අමාත්‍යවරයා අදහස් වේ.

"ලේකම්වරයා" යන්නෙන් තත්කාලයේදී සබරගමුව පළාතේ පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක සේවා විෂයයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

"කොමසාරිස්වරයා" යන්නෙන් තත්කාලයේ ආණ්ඩුකාරවරයා විසින් පත් කරන ලද පරිවාස හා ළමාරක්ෂක සේවා පළාත් කොමසාරිස්වරයා අදහස් වේ.

"ළමා නිවාස ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්" යන්නෙන් සබරගමුව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා අදහස් වේ.

"පරිවාස නිළධාරියා" යන්නෙන් 1944 අංක 42 දරන වරදකරුවන් පරිවාස භාරයට ගැනීමේ ආඥාපනතේ 17 වන වගන්තිය අනුව පත් කරන ලද නිළධාරියෙකු අදහස් වේ.

"නිසි බලධාරියා" යන්නෙන් පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා විසින් පත් කරනු ලබන සබරගමුව පළාතේ පළාත් රාජ්‍ය සේවයේ නියුතු මාණ්ඩලික නිළධාරියෙකු අදහස් වේ.

"පළාත් භාර ගැනීමේ ළමා නිවාසය'' යන්නෙන් අවුරුදු 05 ට අඩු අනාථ අත්හල අසරණ සහ අපයෝජනයට ලක්වූ ළමුන් නේවාසිකව රැකබලා ගැනීම සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් පවත්වා ගෙන යනු ලබන ආයතනයක් අදහස් වේ.

"අපහරණය" යන්නෙන් (15 වන අධිකාරය) දණ්ඩ නීති සංග්‍රහයේ දැක්වෙන අර්ථය ඇත්තේය.

"ස්ථාපනය" යන්නෙන් ළමා නිවාසයක හෝ පළාත් භාර ගැනීමේ ළමා නිවාසයක නේවාසික ළමයෙකු දෙමාපියන් වෙත හෝ භාරකරුවන් වෙත හෝ ඥාතියෙකු වෙත හෝ භාර දීම වෙනයම් ආකාරයකින් ළමයාගේ සුභසිද්ධියට අදාළ වන පරිදි සමාජයට අන්තර් ග්‍රහනය කිරීම අදහස් වේ.

"ස්ථාපන කමිටුව" යන්නෙන් ළමා නිවාසයක නම් එහි කළමනාකරු ප්‍රධාන පාලක අදාළ ළමුන්ගේ දෙමාපියන්/භාරකරුවන් ස්ථානභාර පරිවාස නිළධාරීන් ළමා නිවාස අධීක්ෂණය කරනු ලබන පරිවාස නිළධාරීන් කොමසාරිස් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ ඔහුගේ කාර්යය මණ්ඩලයේ නිළධාරියෙකුගෙන් සමන්විතව පැවැත්වෙන රැස්වීමක් අදහස් වේ. පළාත් භාර ගැනීමේ ළමා නිවාසයක නම් මේට්‍රන්, පළාත් කොමසාරිස්, එම ළමා නිවාසය අධීක්ෂණය කරනු ලබන පරිවාස කාර්යාලයේ ස්ථානභාර පරිවාස නිළධාරී, ළමා නිවාසය අධීක්ෂණය කරනු ලබන පරිවාස නිළධාරී, දෙමාපියන්/භාරකරුවන්ද කොමසාරිස්වරයා විසින් බලය පවරනු ලැබූ නිළධාරියෙකුගෙන් සමන්විතව පැවැත්වෙන රැස්වීමක් අදහස් වේ.

"ස්වේච්ඡා සංවිධානය" යන්නෙන් 1980 අංක 32 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත හා ඊට අදාළ 1998 අංක 08 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) (සංශෝධන) පනත යටතේ ලියාපදිංචි කරන ලද ස්වේච්ඡා සංවිධානයක් අදහස් කෙරේ.

"ළමා නිවාසය" යන්නෙන් අනාථ, අත්හල, අසරණ සහ අපයෝජනයට ලක්වූ ළමයින් භාර ගැනීම ඔවුන් නේවාසිකව තබා ගැනීම ඔවුන්ට භාරය හා ආරක්ෂාව සැපයීම සඳහා ලියාපදිංචි ස්වේච්ඡා සංවිධානය මගින් පවත්වා ගෙන යනු ලබන සියළු ආකාරයේ ආයතන නිවාස හා අධිකරණ මගින් යොමු කරනු ලබන්නා වූ අනාථ, අත්හල, අසරණ හා අපයෝජනයට ලක්වූ ළමයින්, ගර්භණී ළමයින් හා ළමා මව්වරුන් භාර ගැනීම ඔවුන් නේවාසිකව තබා ගැනීම ඔහුට භාරය හා ආරක්ෂාව සැපයීම සඳහා ස්වේච්ඡා සංවිධාන මගින් පවත්වා ගෙන යනු ලබන සියළු ආකාරයේ ආයතන හා නිවාස අදහස් කෙරේ.

## පළමු වන උපලේඛනය

### සබරගමුව පළාත් සභාවේ 20 ..... අංක ...... දරන ළමා නිවාස ප්‍රඥප්තිය යටතේ ළමා නිවාස ලියාපදිංචි කිරීම සඳහා අයදුම් පත්‍රය

01. රාජ්‍ය/රාජ්‍ය නොවන/ අර්ධ රාජ්‍ය / රජයට සම්බන්ධ/ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයේ නම

.......................................................................................................................................................................

(අනවශ්‍ය කොටස් කපා හරින්න)

02. 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන ලියාපදිංචි කිරීමේ හා අධීක්ෂණය කිරීමේ පනත යටතේ ලියාපදිංචි අංකය හා දිනය

.......................................................................................................................................................................

(සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ලියාපදිංචි කිරීමේ සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න)

I. යෝජිත ළමා නිවාසයේ නම

.......................................................................................................................................................................

II. ලිපිනය හා දුරකථන අංකය

.......................................................................................................................................................................

III. ළමා නිවාසය ආරම්භ කර පවත්වාගෙන යාමට අපේක්ෂා කරන රාජ්‍ය/රාජ්‍ය නොවන/අර්ධ රාජ්‍ය/රාජ්‍යට සම්බන්ධ/ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයේ නම

.......................................................................................................................................................................

IV. රාජ්‍ය/රාජ්‍ය නොවන/අර්ධ රාජ්‍ය/රජයට සම්බන්ධ/ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයේ ලියාපදිංචිය පිළිබඳ විස්තර (ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න)

.......................................................................................................................................................................

V. රාජ්‍ය/රාජ්‍ය නොවන/අර්ධ රාජ්‍ය/රජයට සම්බන්ධ/ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයේ අරමුණ

.......................................................................................................................................................................
.......................................................................................................................................................................
.......................................................................................................................................................................
.......................................................................................................................................................................

(ව්‍යවස්ථාපිත පිටපතක් මේ සමග යා කරන්න)

VI. මෙම සංවිධානයේ ව්‍යුහය

| *නිළධාරි මණ්ඩලය* | *නම* | *ලිපිනය* | *දුරකථන අංකය* |
|---|---|---|---|
| ගරු සභාපති | ....................................... | ....................................... | ....................................... |
| ගරු උප සභාපති | ....................................... | ....................................... | ....................................... |
| ගරු ලේකම් | ....................................... | ....................................... | ....................................... |
| ගරු උප ලේකම් | ....................................... | ....................................... | ....................................... |
| ගරු භාණ්ඩාගාරික | ....................................... | ....................................... | ....................................... |
| අනුශාසක | ....................................... | ....................................... | ....................................... |

VII. රාජ්‍ය/රාජ්‍ය නොවන /අර්ධ රාජ්‍ය / රජයට සම්බන්ධ / ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයේ වත්කම්

| | *බැංකු ශාඛාව* | *ගිණුම් අංකය* | *ලියාපදිංචිය ඉල්ලුම් කරනු ලබන දිනට ගිණුමේ ශේෂය* |
|---|---|---|---|
| 1. | ..................................... | ..................................... | ................................................................................. |
| 2. | ..................................... | ..................................... | ................................................................................. |
| 3. | ..................................... | ..................................... | ................................................................................. |

වෙනත් වත්කම්
රාජ්‍ය/රාජ්‍ය නොවන/අර්ධ රාජ්‍ය/රජයට සම්බන්ධ/ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයට අයත් චංචල හා නිශ්චල වත්කම්
(වාහන, ඉඩම්, ගොඩනැගිලි, ව්‍යාපාර යනාදිය හා වෙනත් අදාළ වූ වත්කම් පිළිබඳ විස්තර සපයන්න)

| ජංගම/ස්ථාවර වත්කම් | අංකය (වාහන, ඉඩම්, ඔප්පු අංක පිළිබඳව) | අයිතියේ ස්වභාවය (සින්නක්කර, කුලී, බදු, උකස්) | වර්තමාන වටිනාකම |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

VIII. රාජ්‍ය/රාජ්‍ය නොවන /අර්ධ රාජ්‍ය / රජයට සම්බන්ධ / ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයට විදේශ ආධාර ලබා දෙන ආයතන හා ආධාර ප්‍රමාණය

| ආයතනය | වාර්ෂිකව ලබා දෙන ආධාර ප්‍රමාණය |
|---|---|
| ........................................................................ | ................................................................................ |
| ........................................................................ | ................................................................................ |
| ........................................................................ | ................................................................................ |

IX. රාජ්‍ය/රාජ්‍ය නොවන/අර්ධ රාජ්‍ය/රජයට සම්බන්ධ/ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයේ ගිණුම් කටයුතු කරනු ලබන්නේ කවුරුන් විසින් ද?
........................................................................................................................................................................
........................................................................................................................................................................

2.1 ළමා නිවාසය පවත්වාගෙන යාමට අදහස් කරන කළමණාකරන මණ්ඩලයේ විස්තර

| නම හා තනතුර | වයස | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|
| ............................................ | ......................... | ........................................ | ................................... |
| ............................................ | ......................... | ........................................ | ................................... |
| ............................................ | ......................... | ........................................ | ................................... |
| ............................................ | ......................... | ........................................ | ................................... |
| ............................................ | ......................... | ........................................ | ................................... |
| ............................................ | ......................... | ........................................ | ................................... |
| ............................................ | ......................... | ........................................ | ................................... |

1.1 මෙම ළමා නිවාසය පවත්වාගෙන යාමේ දී යෙදවීමට අපේක්ෂා කරන කළමණාකරුගේ යෝග්‍යතාවය

a. නම : ..................................................................................................................................................

b. උපන් දිනය : ......................................................................................................................................

c. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

d. වෘත්තීය පළපුරුද්ද

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

e. උසාවියේ වරදකරු කර තිබේද යන වග

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

111. යෝජිත ළමා නිවාසයේ ගිණුම් කටයුතු කරනු ලබන්නේ කවුරුන් විසින්ද?

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

3.1 ළමා නිවාසයේ රැකවරණය ලබා දීමට අදහස් කරන්නේ,

a. පිරිමි දරුවන්ද/ගැහැණු දරුවන්ද/මිශ්‍ර ද : ..............................................................................

b. ළමුන්ගේ වයස් සීමාව : ..............................................................................

c. අපේක්ෂිත ළමුන් සංඛ්‍යාව : ..............................................................................

නිවාසය පවත්වාගෙන යාමට යෙදවීමට අපේක්ෂිත සේවක සංඛ්‍යාව

.....................................................................................................................................................

| නම | තනතුර | වයස | අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් | පළපුරුද්ද |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

4. (i) යෝජිත ළමා නිවාසය වෙනුවෙන් ගොඩනැගිලි ඉදිකිරීමට අදහස් කරන/ඉදිකරන ඇති භූමිය සංවිධානය සතුද (සංවිධානය සතු නම් අදාළ විස්තරය හා ඔප්පුවේ සහතික කළ පිටපතක් අමුණන්න)

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

(ii) යෝජිත ළමා නිවාසයේ ඉඩ පහසුකම් කාමර ඇතුළු අනෙකුත් ශාලාවන් පිළිබඳ විස්තර
(ගොඩනැගිලි බිම් සැලැස්මක් ඇමිණිය යුතුය)

| පහසුකම් | දිග | පළල |
|---|---|---|
| a. නිදන කාමර | | |
| b. අධ්‍යාපන කටයුතු වල නිරත වීමට සුදුසු ශාලාව | | |
| c. විවේක ගැනීමට සුදුසු ශාලාව | | |
| d. අමුත්තන් මුණ ගැසීමේ ශාලාව | | |
| e. කාර්යාලය | | |
| f. රෝගීන් සඳහා වෙන් කර ඇති කාමර | | |
| g. ප්‍රතිකාරාත්මක වැඩසටහන් සඳහා වෙන් කරන ලද කාමරය | | |
| h. මුළුතැන්ගෙය | | |
| i. සේවකයින්ගේ නේවාසික කාමර | | |
| j. ගබඩා කාමර | | |
| k. නාන කාමර | | |
| l. වැසිකිළි ප්‍රමාණය | | |
| m. නිදා ගැනීමට සපයා ඇති ඉඩ පහසුකම් | | |
| n. එළි මහනේ ක්‍රීඩා සඳහා ඉඩකඩ ප්‍රමාණය | | |
| o. නිවාසයට අවශ්‍ය ජලය සපයා ගන්නා ක්‍රමය | | |
| p. ප්‍රධාන විදුලිය ලබන්නේද? | | |

5.1 නිවාසයේ ළමුන්ට විධිමත් අධ්‍යාපනය ලබා දීමට අදහස් කරන පාසැල් පිළිබඳ විස්තර

| පාසලේ නම | ළමා නිවාසයට ඇති දුර |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

ii. ළමා නිවාසය තුල දී ලබාදීමට අපේක්ෂිත අමතර අධ්‍යාපන පහසුකම් (විෂය උපකාරක පංති, සංගීත, නැටුම්, වෘත්තීය පුහුණුව)

..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

6.1 නිවාසයේ නේවාසික ළමුන් සෞඛ්‍ය පහසුකම් ලබන්නේ කෙසේද? (ළඟම ඇති රෝහලට ඇති දුර ප්‍රමාණය සඳහන් කරන්න)

.....................................................................................................................................................................
.....................................................................................................................................................................
.....................................................................................................................................................................

ii. ළමා නිවාසය ආරම්භ කිරීමට නියමිත ප්‍රදේශයේ පරිසරයේ ස්වභාවය හා අවට පදිංච ජන කොට්ඨාශයේ ස්වභාවය නාගරික/අර්ධ නාගරික/ගම්බද?

.....................................................................................................................................................................
.....................................................................................................................................................................
.....................................................................................................................................................................

iii. ළඟම ඇති ළමා නිවාසයට ඇති/එම නිවාසය පිරිමි ළමා නිවාසයක් ද/ගැහැණු ළමා නිවාසයක්ද?

.....................................................................................................................................................................
.....................................................................................................................................................................
.....................................................................................................................................................................

iv. ආගමික වතාවත් සඳහා ඇති පහසුකම්

.....................................................................................................................................................................
.....................................................................................................................................................................
.....................................................................................................................................................................
.....................................................................................................................................................................
.....................................................................................................................................................................
.....................................................................................................................................................................

7. ළමා නිවාසයකට ඇතුලත් කරන ළමුන් නැවත සමාජගත කිරීමට/පුනරුත්ථාපනය කිරීමට අපේක්ෂිත ක්‍රමවේදයන් (ළමුන් නිවාසගත කල පසු දීර්ඝකාලීනව ළමා නිවාසයේ රඳවා තැබීම අපේක්ෂා නොකරන අතර හැකි ඉක්මනින් පුනරුත්ථාපනය කර දෙමාපිය/භාරකරුවන් වෙත භාර දිය යුතුය) මෙම ක්‍රමවේදයන් සවිස්තරව සඳහන් කළ යුතුය.

.....................................................................................................................................................................
.....................................................................................................................................................................
.....................................................................................................................................................................
.....................................................................................................................................................................
.....................................................................................................................................................................
.....................................................................................................................................................................

සබරගමුව පළාත් සභාවේ 20 ..... අංක .......................... දරන ළමා නිවාස ප්‍රඥප්තිය යටතේ පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් විසින් කලින් කලට නිකුත් කරන උපදෙස් හා විධිවිධාන වලට අනුකූලව කටයුතු කරන බවට සහතික කරමි. මෙම අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි.

මෙම අයදුම් පත්‍රයේ අප විසින් සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය බවට අනාවරණය වුවහොත් සබරගමුව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් විසින් ඒ පිළිබඳව ගන්නා තීරණයට අපි එකඟ වෙමු.

| | | |
|---|---|---|
| ....................................... | ....................................... | ....................................... |
| ගරු සභාපති | ගරු ලේකම් | ගරු භාණ්ඩාගාරික |

දිනය හා මුද්‍රාව ..........................  දිනය හා මුද්‍රාව ..........................  දිනය හා මුද්‍රාව ..........................

## දෙවන උපලේඛනය

ලියාපදිංචි අංකයඃ .................................

සබරගමුව පළාතේ පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ
ළමා නිවාස ලියාපදිංචි කිරීම

සබරගමුව පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් ..........................................................................................වන මා විසින් ............................................................ දිස්ත්‍රික්කයේ .............................................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ .................................... ............................................................................................................ දරන ස්ථානයේ .................................................................................. නැමැති ළමා නිවාසය සබරගමුව පළාත් සභාව 20 ........... අංක .............................. දරන ළමා නිවාස ප්‍රඥප්තිය විධිවිධාන පරිදි වර්ෂ ............... මස ................... දින ලියාපදිංචි කරන ලදී/වර්ෂ .................................... මස .................................. දින ලියාපදිංචි කරන ලදී/වර්ෂ ....................... මස ...................... දින සිට වර්ෂ ................................... මස ............................ දින දක්වා ලියාපදිංචිය නැවත අළුත් කරන ලදී.

දිනයඃ ..............................

....................................................
පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්,
සබරගමුව පළාත,
(අත්සන හා නිලමුද්‍රාව)

සබරගමුව පළාත් සභාවේ 2 .............. අංක .................. දරන ළමා නිවාස ප්‍රඥප්තියේ
06 .................. වගන්තියට යටත්ව නිකුත් කරන ලදී.

06-677

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.